# සිංහල දෙමළ හා වැදි ජනයා

උතුරු පළාතේ දෙමළ ජනයා අතර ප්‍රධාන කුලය වනුයේ වෙල්ලාල හෙවත් ගොවි කුලය ය. උතුරු ඉන්දියාවේ මෙන් ම දකුණු ඉන්දියාවේ ද ප්‍රධාන කුලය බ්‍රාහ්මණ වුව ද යාපනයේ එසේ නොවන්නේ ඇයි? එයට එක් හේතුවක් ලෙස පෙන්විය හැක්කේ සිංහලයන් සමග අවුරුදු දහස් ගණනක් ජීවත්වීමේ ප්‍රතිඵලයක් ලෙස ගොවි කුලයට ප්‍රධාන තැනක් හිමි වී ඇති බව ය. එහෙත් ඒ එසේ වීමට නම් දෙමළ ජනයා එලෙස අවුරුදු දහස් ගණනක් මෙරට අඛණ්ඩව ජීවත්ව සිටිය යුතු ය. එහෙත් එවැන්නක් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සාධක නැත. දෙවනුව සිංහලයන් අතර ඇති කුළ ක්‍රමයෙහි එවැනි ප්‍රධාන කුලයක පැවැත්මක් නො පිළිගැනෙයි. ගොවි නොවන ඇතැම් කුලයක ජනයා ද සිතන්නේ තම කුලය ප්‍රධාන කුලය බව ය. එහෙත් යාපනයේ එසේ නො වෙයි. වෙල්ලාල නොවන කුලවල ජනයා ද වෙල්ලාල කුලයේ ප්‍රධානත්වය පිළිගනිති.

යාපනයේ වෙල්ලාල කුලය ප්‍රධාන තැන ගැනීමට හේතුව ද ඇත්තේ ඔවුන්ගේ සම්භවයෙහි ම ය. යාපන වැසියන්ගෙන් බහුතරය පැවතෙන්නේ ලන්දේසින් විසින් දුම්කොළ වගාවට මෙරටට ගෙන්වනු ලැබූ කෝරමණ්ඩල වෙරළ වැසියන්ගෙනි. ඔවුහු ඉන්දියාවේ දී කවුරුන් වුව ද ලංකාවේ දී ගොවියෝ වූහ. ආඩියා සහිත මිඳ යාපනයට ගෙන ආවෝ ද ඔවුහු ම වෙති. මේ ගොවියෝ යාපනයේ එවකට සිටි සිංහල හා වේලක්කාර ජනයා විවිධ කුලවලට ඇතුල්කර ඔවුන් ද දෙමළ සංස්කෘතියට අවශෝෂණය කර තම වෙල්ලාල ආධිපත්‍යය යාපන සමාජයෙහි පිහිටුවූහ. ලන්දේසීන්ට අවශ්‍ය වූයේ දුම්කොළ වගාවට ගොවීන් මිස බ්‍රාහ්මණයන් නො වේ. යාපන සමාජයෙහි ඉන්දියාවෙහි මෙන් බ්‍රාහ්මණ කුලයේ ආධිපත්‍යයක් ඇති නොවීමට හේතුව වූයේ එය ය.

නැගෙනහිර පළාතෙහි දෙමළ ජනයා පදිංචි කරවනු ලැබුයේ ඉංගිරිසින් විසිනි. (ඇමරිකාවේ කෝනල් විශ්වවිද්‍යාලය අනුව යමින් මෙරට ථෙරවාදයට හිමිතැන අහිමි කරමින් ලංකා ඉතිහාසය ලිවීමට අවුරුදු විස්සක් පමණ කාලයක් තිස්සේ උත්සාහ කරන බොරු පණ්ඩිතයෙක් ඉංගිරිසි යන්න වෙනුවට ඉංගිලිස් යන්න නිරන්තරයෙන් ම යොදයි. ඔහු සිතන්නේ ඉංග්ලිෂ් යන්න ඉංගිලිස් මිස ඉංගිරිසි නොවිය හැකි බව ය. ඔහු සිංහල සම්ප්‍රදාය නොදනියි. ර සහ ල අකුරු සිංහලයෙහි මාරු වී යෙදෙන බව ඔහු නො දන්නා බව පැහැදිලි ය.) එවකටත් නැගෙනහිර පළාතෙහි සිංහල රජු විසින් පදිංචි කරවනු ලැබ සිටි මුස්ලිම් ජනයා විසූ ගම්මාන අතර ඉංගිරිසිහු කම්කරු වැඩ සඳහා දකුණු ඉන්දියාවෙන් ගෙන්වූ දෙමළ ජනයා පදිංචි කරවූහ. අද ද නැගෙනහිර පළාතේ දෙමළ හා මුස්ලිම් ජනගහණය වෙරළබඩ ප්‍රදේශවලට පමණක් සීමාවන්නේත් එහි ජන සංයුතිය පිට්ටු බම්බුවෙහි පොල් පිටි ආකාරයෙන් දෙමළ මුස්ලිම් ජනතාවගෙන් සමන්විත වන්නේත් මේ හේතුවෙනි. එදා මෙන් අද ද නැගෙනහිර පළාතේ ඉතා වැඩි ඉතිරි කොටසෙහි ජනගහණය සිංහල බව බොහෝ දෙනාට අමතක ය.

මෙලෙස නැගෙනහිර පළාතේ වෙරළබඩ පදිංචි කරවනු ලැබූ දෙමළ ජනයා පහත් යැයි සම්මත වෘත්තීන්හි යොදනු ලැබූවන් වීමෙන් ඔවුහු යාපනයේ ඊනියා කුලීන වෙල්ලාලයන්ගේ කුල මානයට ගොදුරු වී තාඩන පීඩනවලට ලක්වූහ. යාපනයේ වෙල්ලාලයන් නැගෙනහිර පළාතේ වෙරළබඩ වාසය කරන දෙමළ ජනයාට සැලකීමට පටන්ගත්තේ උතුරු හා දෙමළ පළාත්වල වෙන ම යාපන නායකත්වයකින් දෙමළ රාජ්‍යයක් පිහිටුවාගැනීමේ අරමුණින් බව නැගෙනහිර පළාතේ වෙරළබඩ දෙමළ ජනයා නොදන්නවා නොවිය හැකි ය. කරුණා හා පුල්ලියාන් දේශපාලනයෙහි පදනමේ ඇත්තේ නැගෙනහිර වෙරලබඩ දෙමළ ජනයාට යාපන නායකත්වයෙන් නිදහස්වීමට ඇති වුවමනාව ය.

ලංකාවේ තබා ඉන්දියාවේවත් (භාරතයේවත්) ඉතිහාසයේ කිසි දිනෙක දෙමළ ජාතියක් හෝ දෙමළ රාජ්‍යයක් හෝ නොවූ බැවි අපි සඳහන් කෙළෙමු. එහෙත් සිංහලයන් සම්බන්ධයෙන් තත්වය එසේ නො වී ය. සිංහලයෝ පණ්ඩුකාභය රජු දවස සිංහල ජාතිය ද සිංහල රාජ්‍යය ද බිහිකළහ. පණ්ඩුකාභය කතාවේ යම් යම් පරස්පර ඇත්නම් එයට හේතුව ද මේ ජාතිය බිහිවීමේ දී ඇති වූ පරස්පර ය. ජාතිය පිළිබඳ ව බටහිර සමාජීය විද්‍යාඥයන් කරන ප්‍රකාශ අපි ප්‍රතික්ෂෙප කරමු. ඇතැම් බටහිර උගතුන්ට අනුව ජාතියක් ඇතිවිය හැක්කේ ධනවාදී ක්‍රමය යම් පමණකට වර්ධනය වීමෙන් පසුව ය. එහෙත් මේ වර්ධනය විය යුතු ප්‍රමාණය කෙතෙක් දැයි ඔවුහු නො කියති. එබැවින් එය වැදගත් ප්‍රකාශයක් නො වෙයි. අනෙක් අතට ඇතැම් බටහිර උගතුන්ට අනුව ජාතිය යනු මිථ්‍යාවකි. ඒ ඔවුන්ට ජාතිය යනු

© Prof. Nalin De Silva

කුමක් දැයි නිර්වචනය කිරීමට නොහැකිවීම නිසා තම අසාර්ථක බව (අසමත් බුද්ධිමත්තු - ෆේල්ඩ් ඉන්ටලෙක්චුවල්ස්) වසාගැනීමට කරන උප්පරවැට්ටියක් පමණකි. ජාතියක් නැතැයි කියන උගත්තු ම ජනවර්ග ඇතැයි පවසති. ජනවර්ගයක් හඳුනාගත හැකි නම් ජාතියක් හඳුනාගැනීම අපහසු නො වෙයි. ජනවර්ගයක් ජාතියක් වීම සඳහා තිබිය යුතු මූලික ම අංගය වනුයේ රාජ්‍ය ය. යම් සංස්කෘතියක් හා ජීවනරටාවක් ඇති ජනවර්ගයකට නිශ්චිත භූමි ප්‍රදේශයක නිශ්චිත රාජ්‍යයක් ඇත්නම් ඒ ජනවර්ගය තවදුරටත් ජනවර්ගයක් නොවී ජාතියක් බවට පත්වෙයි. මේ පිළිබඳ වැඩි විස්තර විදුසර පත්‍රයෙහි අපේ ප්‍රවාද ලිපි පෙළෙහි සඳහන් වෙයි.

පණ්ඩුකාභය හෙවත් පකුණ්ඩක කුමරු දවස සිදුවූයේ කුමක් ද? එකලට සියවස් හයකට හතකට පළමු දඹදිවින් (භාරතයෙන්) අර්ධ වෛදිකයෝ මෙරටට පැමිණීමට පටන්ගත්හ. විජයගෙන් සංකේතවත් වන්නේ මේ සංසිද්ධිය ය. එසේ පැමිණි අර්ධ වෛදිකයෝ මෙරට එවකටත් සිටි යක්ෂ නාග දේව ආදී විවිධ ගෝත්‍ර සමග එකතු වී (යුද්ධ හා ආවාහ විවාහවලින් පසුව) පණ්ඩුකාභය රජු දවස සිංහල ජාතිය හා සිංහල රාජ්‍යය ගොඩනැගූහ. අප තේරුම් ගන්නා ආකාරයට සිංහල ජාතිය ගොඩනැගීමේ දී නාග ගෝත්‍රිකයන්ගෙන් විරුද්ධතාවක් පැන නොනැගුණු නමුදු යක්ෂ ගෝත්‍රිකයන්නේ යම් පිරිසක් එයට විරුද්ධ වී ඇත. ඒ විරුද්ධතාව මෑතක් වන තුරුම සිංහල සංස්කෘතියෙහි හා ඇතැම් ප්‍රදේශවල පිළිබිඹු විය.

සිංහල ජාතියට ඇතුල්වීමට අකමැති වූ ගෝත්‍රයක් ද තිබූ බව පැහැදිලි ය. ඒ අන් කිසි ගෝත්‍රයක් නොව ව්‍යාධ ගෝත්‍රය නෙවත් වැදි ජනතාව ය. වැදි ජනතාව ජනප්‍රවාදයට අනුව විජයගෙන් හා කුවේණියගෙන් පැවතෙන නමුදු සිංහල වී නොමැත. මේ ජනප්‍රවාදවලට සංගත අරුතක් දීමට වෑයම් කිරීමේ දී  පෙනී යන කරුණු නම් යක්ෂ ගෝත්‍රික ඇතැම් පිරිස් සිංහල ජාතිය ගොඩනැගීමේ දී දැක්වූ විරුද්ධතාවත් වැදි ජනතාව මුළුමනින් ම සිංහල ජාතියෙන් බාහිර ව විසීමට දැක්වූ අභිලාෂයත් ය. වැදි ජනතාවට සිංහල ජාතියෙන් බාහිර ව සිටීමට ඇතැම් යක්ෂ නායකයන් උපදෙස් දී ඇති බව ද ජනප්‍රවාදයෙන් ගම්‍ය වෙයි. සිංහලයන් ඉතාමත් ජනසම්මතවාදී ව වැදි ජනතාවගේ අභිලාෂයට ඉඩ දී ඇති බව පැහැදිලි ය. සිංහලයෝ යුදෙව්වන් මෙන් හෝ පසුව පැමිණි යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට අයත්වූවන් මෙන් හෝ කටයුතු කර වැදි ජනතාව බලයෙන් හෝ උපක්‍රමශීලීව හෝ සිංහල සංස්කෘතියට ඇතුල්කිරීමට උත්සාහ නොගත්හ. අවුරුදු දෙදහසකට වැඩි කලක් සිංහලයන් සමග ජීවත්වෙමින් තම අනන්‍යතාව රැකගැනීමට වැදි ජනතාවට හැකි වී ඇත්තේ සිංහලයන් ජනසම්මතවාදයට දැක්වූ ගෞරවය හේතුකොට ගෙන ය. අවශ්‍ය නම් වැදි ජනතාව සිංහල කිරීමේ යුද්ධ හා ආර්ථික හැකියාව සිංහලයන් අතු වූ බව පැහැදිලි ය. එහෙත් මෑතක් වන තුරුම සිංහලයෝ එසේ නො කළහ. අද වැදි ජනතාව සිංහල සංස්කෘතියට අවශෝෂණය වෙමින් සිටින්නේ ලෝක මට්ටමින් ක්‍රියාත්මක වන යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියේ බලපෑම ඉදිරියේ ය. ඒ බලපෑම හමුවේ සිංහලයෝ ද ක්‍රමයෙන් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිතවාදයට ගොදුරු වෙමින් සිටිති.

මෙහි දී කිවයුතු තවත් වැදගත් කරුණක් වෙයි. වැදි ජනතාව මෙරට ආදිවාසීහු නො වෙති. ආදිවාසි හෙවත් ඇබොරිජින් යන නමින් හඳුන්වන්නේ නව ජාතියක් හෝ ජනවර්ගයක් හෝ පිටතින් පැමිණ පිහිටුවීමට පෙර යම් රටක සිටි ජනවර්ගයට ය. එහි දී නව ජනවර්ගය විසින් ආදිවාසීහු බොහෝ විට තාඩන පීඩන වලට ලක්කෙරෙති. ඇතැම් විට සමූලඝාතනය කෙරෙති. වැද්දන් ආදිවාසීන් නොවන්නේ සිංහලයන් මෙරටට පිට රටකින් පැමිණි ජාතියක් හෝ ජනවර්ගයක් හෝ නොවීම නිසාත් වැද්දන් හැරුණු විට තවත් ජනවර්ග මෙරට එකල වාසය කළ නිසාත් ය. සිංහලයෝ ඕස්ට්‍රේලියාවට හෝ ඇමරිකාවට සංක්‍රමණය වූ බ්‍රිතානීන් මෙන් නොවූහ. බ්‍රිතානීහු මුළුමනින් ම බ්‍රිතානියේ වැසියෝ වූහ. එහෙත් සිංහලයෝ ලංකාවෙන් ම බිහි වූ ජාතියකට අයත් වෙති. අර්ධ වෛදිකයන් මෙරටට පිටින් පැමිණි බව සැබෑ ය. එහෙත් අර්ධ වෛදිකයෝ සිංහලයෝ නො වූහ. සිංහල ජාතිය ගොඩනැගීමට වැද්දන් සමග මෙරට ජීවත් වූ යක්ෂ නාග දේව ආදී ගෝත්‍රිකයෝ ද සහභාගි වූහ. එබැවින් සිංහලයන්ට ද ඊනියා ආදි වාසී සම්භවයක් වෙයි. වැද්දන්ට පමණක් ආදිවාසීන් යැයි කීමට බටහිර උගතුන් අප පොළඹවන්නේ සිංහලයන් මෙරටට පිටින් පැමිණි බවත් ඒ හේතුවෙන් පිටින් පැමිණි දෙමළ ජනයා හා සමාන බවත් පෙන්වීමට ය. සිංහල දෙමළ මුස්ලිම් සමානත්වයෙන් සැලකීමට පුරුදු වී ඇති ඇතැම් දේශපාලන පක්ෂවලට බටහිරයන්ගේ මේ කතා (බයිලා) රසවත් විය හැකි නමුත් අපි වැද්දන් හැඳින්වීමට ආදිවාසීන් යන සංකල්පය යෙදීමෙන් වළකිමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva